// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2148/22 – 2019 නොවැම්බර් 06 වැනි බදාදා – 2019.11.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරුළපන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/DSO/2015/197 හා 2015.10.02 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලි සඳහා මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – වරිපනම් අංක 200 (කොටසක්) හයිලෙවල් පාර – ප්‍රමාණය: හෙක්. 0.0202**

උතුරට: කාවින්ද පෙදෙස සහ හයිලෙවල් පාරේ වරිපනම් අංක 200/3 දරන ඉඩම; නැගෙනහිරට: හයිලෙවල් පාරේ වරිපනම් අංක 200 දරන ඉඩම; දකුණට: හයිලෙවල් පාරේ වරිපනම් අංක 200, කාවින්ද පෙදෙසේ වරිපනම් අංක 5 දරන ඉඩම් සහ මෙම පිඹුරේ කැබලි අක්ෂර B; බටහිරට: කාවින්ද පෙදෙස.

02. **කැබලි අක්ෂර 'B' – වරිපනම් අංක 5 (කොටසක්) කාවින්ද පෙදෙස – ප්‍රමාණය: හෙක්. 0.0177**

උතුරට: කාවින්ද පෙදෙස, මෙම පිඹුරේ කැබලි අක්ෂර A සහ හයිලෙවල් පාරේ වරිපනම් අංක 200 දරන ඉඩම; නැගෙනහිරට: කාවින්ද පෙදෙසේ වරිපනම් අංක 5 දරන ඉඩම; දකුණට: කාවින්ද පෙදෙසේ වරිපනම් අංක 5, 7/1 දරන ඉඩම් සහ කාවින්ද පෙදෙස; බටහිරට: කාවින්ද පෙදෙස.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2014/PC/373.
2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11-1327